**ශීර්ෂය -327- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 06 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

---

### 2.1 විසර්ජන ගිණුම

---

#### (අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 387.97 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 376.66 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 11.31 ක් හෙවත් සියයට 2.92 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 322.97 | 320.67 | 2.30 | 0.71 |
| මූලධන | 65.00 | 55.99 | 9.01 | 13.86 |
| **එකතුව** | **387.97** | **376.66** | **11.31** | **2.92** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දෙපාර්තමේන්තුව වෙත වෙනත් අමාත්‍යාංශ 03 ක් විසින් එකතුව රු. මිලියන 25.8 ක ප්‍රතිපාදන එවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු මිලියන 23.9 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබාදී තිබූ ප්‍රතිපාදනවලින් රු. මිලියන 1.9 ක් හෙවත් සියයට 7 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **ප්‍රතිපාදන සලසා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව** | **දිනට 31 දෙසැම්බර් 2015** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 0.80 | 0.73 | 0.07 | 8.75 |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 20.00 | 18.48 | 1.52 | 7.60 |
| වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 5.00 | 4.66 | 0.34 | 6.80 |
| **එකතුව** | **25.80** | **23.87** | **1.93** | **7.48** |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 32701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 20.92 | 20.91 | 10.92 | 13.51 | 65.00 | 55.15 |

## 2.3 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/000/0414/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු. මිලියන 9.76 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

-----------------------

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 04 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. 504,728 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0161/000 | 3,000 |
| 6000/0000/00/0013/0114/000 | 162,707 |
| 6000/0000/00/0016/0104/000 | 291,821 |
| 6000/0000/00/0018/0105/000 | 47,200 |
| **එකතුව** | **504,728** |

**2.5 විගණන නිරීක්ෂණය**

---------------------

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලැසුම් දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

--------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

--------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර අනෙක් ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලින කර නොතිබුණි . |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | දිනැති 19 දෙසැම්බර් 1978 දරන භාණ්ඩාගාර 842 අංක ලේඛයවක්‍ර | පවත්වා නොතිබුණි. |
| (iii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | දිනැති 28 නොවැම්බර් 2002 02/2002/අංක අයිඒඅයිදරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | විදුලි උපකරණ ලේඛනය | පිළිබඳ මුදල් රෙගුලාසි | (2)454 | පවත්වා නොතිබුණි. |
| (v) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි | )1647ඉ) | පවත්වා නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**-------------------**

**3.2.1 අයවැය විචනය**

**--------------------**

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 70 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් බී ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------------**

විෂය අංක 32701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ස්ථාන මාරුවී ගිය නිලධාරිණියකගේ රු. 184,250 ක හිඟහිටි ණය ශේෂයක් වර්ෂ 03ක පමණ කාලයක සිට පැවැත එමින් තිබුණත්, එම ශේෂය අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**---------------------------------------**

**3.4.1 අභ්‍යන්තර විගණනය**

**----------------------**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින්ද දිස්ත්‍රික් කාර්යාල ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයන් සිදුකර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**----------------------------**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**---------------------------------------------------------------**

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව දෙපාර්තමේන්තුව විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) ඉඩම් අමාත්‍යාංශය සතු රු. මිලියන 44.4 ක් වටිනා වාහන 06 ක් දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි පවරා නොගෙන භාවිතයට ගෙන තිබුණි.

(ii) වටිනාකම් හෙලිදරව් නොවූ ඉඩම් අමාත්‍යාංශය සතු තවත් වාහන 06 ක් සහ තවත් ආයතන 03 ක වාහන 03 ක් දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි පවරා නොගෙන භාවිතයට ගෙන තිබුණි.

**3.6 කාර්යසාධනය**

-------------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

ප්‍රතිශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 02 ක ප්‍රගතිය සියයට 43 ක් හා සියයට 53 ක් වී තිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

------------------------------------------------------

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 23 | 17 |
| (ii) | තෘතියික මට්ටම | 01 | - | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 547 | 518 | 29 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 97 | 82 | 15 |
| | **එකතුව** | **685** | **623** | **62** |

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

------------------------------------------------------------------------

2002 වර්ෂයේ සිට ඉඩම් පරිහරණ සැලැසුම් නිලධාරියකු ඉඩම් අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.